## සූර්යබල පද්ධතියක් සවි කිරීමේදී

- ලංකා විදුලි බල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගමෙහි නිර්දේශයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ ලියාපදිංචි සුදුසුකම් ලත් සේවා සැපයුම් ආයතන තෝරා ගැනීම කල යුතුය.
- සූර්යබල පද්ධති ස්ථාපනයේදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI : 1522) මගින් හඳුන්වා දී ඇති ප්‍රමිති කාර්ය සංග්‍රහයට අනුකූලව ඉහල ප්‍රමිතියෙන් යුතු සූර්ය පැනල, ඉන්වර්ටර්, සූර්යබල පද්ධති සපයන පළපුරුදු තාක්ෂණික නිලධාරීන් සිටින ආයතනයක් තෝරා ගැනීම කල යුතුය.

## සූර්යබල සංග්‍රාමය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ආයතන

**ලංකා විදුලිබල මණ්ඩලය සහ ප්‍රාදේශිය විදුලි ඉංජිනේරු කාර්යාල**
අංක 50,
ශ්‍රී චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත,
කොළඹ 02.
0112 324 471
www.ceb.lk

**ලංකා විදුලි පුද්ගලික සමාගම සහ ප්‍රාදේශිය විදුලි ඉංජිනේරු කාර්යාල**
අංක 411, ගාලු පාර,
කොළඹ 03.
0112 371 600
www.leco.lk

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**
5 වන ගොඩනැගිල්ල, පළමු මහල, BMICH, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
0112 697 375 www.energy.gov.lk 011- 2682534

**HOTLINE : 0112 677 445**

www.powermin.gov.lk Soorya Bala Sangramaya

# සූර්ය බල සංග්‍රාමයේ ප්‍රගතිශීලි හැරවුම සමඟ ඔබත් එක්වන්න.

'රටට ආදරය කරන මිනිසුන් පරිසරයට ආදරය කරයි, පරිසරයට ආදරය කරන මිනිසුන් සූර්ය බල ශක්තියට ආදරය කරයි'

**විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය**

# සූර්ය බල සංග්‍රාමය

## සූර්ය බලශක්තියේ ප්‍රගතිශීලී හැරවුම

| | | |
|---|---|---|
| නිවාස | ආගමික ස්ථාන | සංචාරක හෝටල් |
| ව්‍යාපාරික ස්ථාන | කාර්යාල | කර්මාන්ත ශාලා |

## දස ලක්ෂයක සූර්ය බලාගාර



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලි පුද්ගලික සමාගම

වසර 2050 වන විට ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සම්පූර්ණ විදුලිය ප්‍රමාණය දේශීය/පුනර්ජනනීය මූලාශ්‍ර වලින් ලබාගැනීම රජයේ අපේක්ෂාවයි.

මේ සඳහා මූලික පියවරක් ලෙස විදුලි පාරිභෝගිකයන් ද විදුලි නිෂ්පාදකයින් වශයෙන් විදුලි ජනන ක්‍රියාවලියට සම්බන්ධ කර ගනිමින් තම නිවෙස්වල වහල මත ඉදි කෙරෙන කුඩා සූර්ය බලාගාර ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් '**සූර්ය බල සංග්‍රාමය**' නමින් ක්‍රියාවට නංවයි. මේ යටතේ විදුලි පාරිභෝගිකයින් මිලියනයක් විදුලි නිෂ්පාදකයින් බවට පත් කිරීමට අපේක්ෂිත අතර, නිෂ්පාදනය කර ජාතික විදුලිබල පද්ධතියට එකතු කරනු ලබන අතිරික්ත විදුලිය සඳහා රජය විසින් ගෙවීම් කිරීමටද නියමිතය.

ඕනෑම විදුලි පාරිභෝගිකයෙකුට, මෙම ව්‍යාපෘතිය යටතේ තම වහලය සූර්ය විදුලි බලාගාරයක් බවට පත් කළ හැකියි.

**2020 වසර වන විට 200 MW හා 2025 වසර වන විට 1,000 MW ධාරිතාවයෙන් යුතු සූර්ය බල විදුලිය නිපදවීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.**

## මෙම ව්‍යාපෘතියෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ

1. ජාතික විදුලිබල පද්ධතිය හා බැඳුණු පරිසර හිතකාමී විදුලිබල නිෂ්පාදනයට දායක වීම සහ එමගින් අමතර ආදායමක් උපයා ගැනීමට හැකිවීම.
2. වසර 7 ක් තුළ නැවත ගෙවීමේ පදනම මත ක්‍රියාත්මක වන රාජ්‍ය සහ පෞද්ගලික වාණිජ බැංකු මගින් ක්‍රියාත්මක සහනදායී ණය පහසුකම් ලබාගැනීමට හැකිවීම.
3. සූර්ය බල සංග්‍රාමයේ ඉදිරිපත් කොට ඇති යෝජනා ක්‍රම තුනෙන් එක ක්‍රමයකට අනුගතව දිවයිනේ ඕනෑම ස්ථානයක විදුලි පාරිභෝගිකයෙකුට ප්‍රතිලාභ ලැබිය හැකි වීම.
4. ජාලගත ශුද්ධ මණුකරන පද්ධතිය සවි කිරීමට ඔබගේ නිවසේ දැනට පවතින ගෘහස්ථ විදුලි රැහැන් පරිපථයේ වෙනසක් සිදු කිරීම අවශ්‍ය නොවීම.

## මෙම ව්‍යාපෘතියෙන් රටට ලැබෙන ප්‍රතිලාභ

1. සූර්ය බලය නොමිලේ ලැබෙන බලශක්ති ප්‍රභවයක් බැවින් ගල් අඟුරු හා පොසිල ඉන්ධන සඳහා වැය වන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රටට ඉතිරි වීම.
2. පරිසර හිතකාමී සූර්ය බලශක්ති භාවිතය මගින් වාර්ෂිකව මෙ.ටො. 150,000 ක පමණ $CO_2$ වායු විමෝචන වලක්වාගැනීම සහ ගෝලීය උණුසුම ඉහල යාම වලක්වා ගැනීමට දායක වීම.
3. සූර්ය විදුලි බලාගාර දිවයින පුරා විසිරීමෙන් ජාතික විදුලිබල පද්ධතියේ ස්ථායිතාවය තහවුරු වීම.
4. විදුලිබල සම්ප්‍රේෂණයේදී හා බෙදාහැරීමේදී සිදුවෙන බලශක්ති හානිය අවම වීම.
5. දැනුවත් ප්‍රජාවක් හා පරිසර හිතකාමී ජන සමාජයක් බිහිවීම.
6. ඍජු සහ වක්‍ර නව රැකියා අවස්ථා දහස් ගණනක් බිහිවීම.
7. අඩු ආදායම්ලාභී පවුල් නව ක්‍රමය යටතේ විදුලි නිෂ්පාදකයක් බවට පත්වීම තුල ආදායම් බෙදී යාමේ විෂමතාවය අවම වීම.


## මසකට නිපදවිය හැකි විදුලි ඒකක ප්‍රමාණය

**1 kW ජාලගත සූර්ය බලශක්ති පද්ධතියකින් මාසිකව විදුලි ඒකක 110-130 kWh අතර නිපදවා ගත හැකිය.**

## ලංකා විදුලිබල මණ්ඩලය හා LECO ආයතනය මගින් අතිරේක විදුලිය වෙනුවෙන් ප්‍රතිලාභීන් වෙත ගෙවීම් සිදු කරන ආකාරය

| ගෙවීම් සිදු කරන ආකාරය | ඒකකයකට රු.ශත(kWh) |
|---|---|
| 1. මුල් වසර 7 ට | 22.00 |
| 2. 8 වන වසර සිට 20 වන වසර දක්වා | 15.50 |

## ජාල ගත සූර්ය බල පද්ධතියක දළ සටහන




## ඔබගේ විදුලි පරිභෝජන රටාව හා කැමැත්ත අනුව අප ඉදිරිපත් කරන පහත යෝජනා ක්‍රම තුනෙන් එක් ක්‍රමයක් තෝරාගත හැක

### 1. ශුද්ධ මණුකරන (Net Metering) ක්‍රමය

වහල මත සවිකරන සූර්ය පැනල මගින් ජනනය කරන විදුලිය ඒකක ගණන, පරිභෝජනය කරන විදුලි ඒකක ගණනට වඩා අඩුනම් එම වෙනසට පමණක් පාරිභෝගිකයා විසින් විදුලිබල මණ්ඩලයට මුදල් ගෙවීම.

**(ජනනය කරන ඒකක ප්‍රමාණයේ අතිරික්තයක් ඇත්නම් හිග අවස්ථාවන් වලදී හිලව් කිරීමට එම ශේෂය ඉදිරියට ගෙනයාමට හැක. මෙහිදී නිවාස හිමියා අතට මුදල් ලැබීමක් සිදුවන්නේ නැත.)**

### 2. ශුද්ධ ගිණුම්කරණ (Net Accounting)

වහල මත සවිකරන සූර්ය පැනල මගින් ජනනය කරන විදුලි ඒකක ගණන නිවාස හිමියා විසින් පාවිච්චි කරන ලද විදුලි ඒකක ගණනට වඩා වැඩි නම් අතිරික්ත ඒකක ප්‍රමාණය සඳහා විදුලිබල මණ්ඩලය මගින් ඉහත වගුවේ සඳහන් පරිදි නිවාස හිමියාට මුදල් ගෙවීම් කරයි.

**(නිවසේ ජනනය කළ විදුලි ප්‍රමාණය භාවිතා කළ ප්‍රමාණයට අඩුනම් වෙනසට ගෙහිමියා මණ්ඩලයට ගෙවීම් කළ යුතුය.)**

### 3. නෙට් ප්ලස් ක්‍රමය (Net Plus)

වහල මත සවිකරණ සූර්ය පැනල මගින් නිෂ්පාදනය කරන සම්පූර්ණ විදුලි ඒකක ගණන විදුලිබල මණ්ඩලය විසින් ඉහත වගුවේ සඳහන් මිල ගණන් පරිදි නිවාස හිමියාගෙන් මිලදී ගෙන ගෙවීම් සිදු කරනු ලබයි.

**නිවසේ බිල්පත දැනට ගෙවන පරිදිම ගණනය කර ගෙහිමියා විසින් මණ්ඩලයට ගෙවීම් සිදුකළ යුතුය.**